මගේ අංකය: JSE/SEC/CIR/2021

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

**දෛනික නඩු භාණ්ඩ භාර ගැනීම තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ දැන්වීමයි**

ශීර්ෂගත කරුණට අදාලව ආණ්ඩුවේ රස පරීක්ෂක ජී. රමනා මහත්මිය විසින් මා වෙත යොමු කර ඇති අංක GAD/AD - 05/COVID -19 හා 2021.05.05 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එම ලිපියේ සඳහන් කරුණු ඔබගේ අවධානයට ලක් කරන ලෙස මට නියම කර ඇත.

02. අදාල ලිපියෙහි පිටපත මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 මැයි මස 18 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
*E-mail* : govanalyst@sltnet.lk

මගේ අංකය / எனது இல. / My No. GAD/AD-05/COVID-19
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021.05.06

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT COLOMBO 12
10 MAY 2021

ලේකම්,

අධිකරණ සේවා කොමිෂන් සභාව,

කොළඹ 12.

**<u>දෛනික නඩු භාණ්ඩ භාරගැනීම තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ දැන්වීමයි.</u>**

රට තුල කෝවිඩ් වෛරසය සීග්‍රයෙන් පැතිරෙමින් පවතින අතර, මෙම දෙපාර්තමේන්තුවේද නිළධාරීන් දෙදෙනෙකු කෝවිඩ් ආසාධිතයන් ලෙස හඳුනාගෙන ඇත. එම නිළධාරින්ගේ සමීප ආශ්‍රිතයන් රැසක් ස්වයං නිරෝධායනයට ලක්කර ඇති අතර PCR පරීක්ෂණ සඳහා ද යොමුකර ඇත.

2. දෛනිකව දෙපාර්තමේන්තුවට නඩුභාණ්ඩ රැගෙන, පොලිස් නිළධාරීන් මෙන්ම සෞඛ්‍ය අංශයේ නිළධාරින්ද විශාල වශයෙන්පැමිණෙන අතර, නඩු භාණ්ඩ භාර ගැනීම තුලින් තවදුරටත් වෛරසය පැතිරීමේ ඉඩකඩ අධිකය. එවැනි තත්වයක් උත්ගතවුවහොත් දෙපාර්තමේන්තුව මුලුමනින්ම වසා දැමීමට සිදුවීමේ දැඩි අවධානමක් පවතී.

3. මෙම තත්වය සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශයේ අදහස් ද සැලකිල්ලට ගෙන, නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු අඛණ්ඩව පවත්වා ගනිමින් නඩු භාණ්ඩ භාර ගැනීම පමණක් 2021.05.05 දින සිට තාවකාලිකව නතර කිරීමට දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදී.(එසේ වුවද ජාතික වැදගත් කමකින් යුත් සහ ඉතා හදිසි නඩුභාණ්ඩ පමණක් භාර ගැනිමට කටයුතු කරනු ඇත.)

4. මේ පිළිබඳව දිවයිනේ අදාළ අධිකරණ දැනුවත් කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

ජී. මේන්ත
ආණ්ඩුවේ රස පරීක්ෂක